


ජනාධිපතිතුමා අතින් ශිෂ්‍යත්වයක් පිරිනැමේ

# මහපොලෙන් ආයාචනයක්

අපි සියල්ලෝම මිනිසුන් වෙමු. තරාතිරම තුළින් හෝ වේවා, අතමිට තිබුණා හෝ නොතිබුණා හෝ වේවා සෙස්සනට නිරතුරුවම කාරුණික භාවයෙන් සලකන්නට අනුබල දෙන මිනිස් හැඟීම අප සියල්ලන් තුළම ඇත. කෙනෙකුගේ දුක්දී තවෙකෙකුගේ නෙතකට කඳුලක් උනන, කෙනෙකුගේ සැපේදී අනෙකාගේ සිතද සැනසෙන ආකාරයෙන් එකිනෙකා කෙරෙහි බැඳුණු අපූරු මනුෂ්‍යත්වයක් ඔබ අප සතුව ඇත්තේය.

මිනිසා තිරිසනුන්ගෙන් ඈත් කොට දේවත්වයට වඩාත් ලංකරන්නේ ඒ උදර මනුෂ්‍යත්වයයි.

නැතිබැරි කෙනෙකු වෙනුවෙන් යමක් පිරිනැමෙන, කෙනෙකු දුකේදී වඩා ලංවන, සිත සැනසෙන වදනක් පැවසෙන, නැගී සිටින්නට වෙර දරන කෙනෙකු වෙත ආධාරයට අතක් දිගුවන සෑම තැනෙකදීම ඔබේත් අපේත් ඒ මිනිස්කම මොනවට පිළිබිඹු වන්නේය.

### උදරතර කාර්යයක්.

ඔබ තුළ තිබෙන කාරුණිකභාවයත්, ඉන් ඔප ගැන්වුණු මිනිස්කමත් ප්‍රකාශ කළ හැකි තවත් අවස්ථාවක් දැන් උදාවී ඇත්තේය. ඔබට හැකි වීටෙක හැකි පමණින් මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදලට පරිත්‍යාගයක් කරන්න. එහි අරමුණ දක්ෂතාවය හා කුසලතාවය ඇති එහෙත් අගහිඟකම් වලින් පෙළෙන සිසුනට උදව් කිරීමයි.

ශ්‍රී ලංකාවේ අපගේම ජන සමාජයේ කෙනෙකුට උසස් අධ්‍යාපනයක් ලබාගැනීම සඳහා උදව් කිරීම තරම් උතුම් පිංකමක් තවත් වේද? එම පරිත්‍යාගය දෙන්නාටත්, ලබන්නාටත්, පමණක් නොව මුළු මහත් ජාතියටත් ආශිර්වාදයක් වනු ඇත.

### දිළිඳුකම තුරන් කිරීම.

ශ්‍රී ලංකාව අද මුහුණ දී ඇති ප්‍රශ්න වලට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ දිළිඳුකම යයි

සිතන්නට බොහෝ හේතු තිබේ. එය වඩාත් සාර්ථක ලෙස මුලිනුපුටා දැමිය හැකි ක්‍රමය නම් නිකම්ම ජීවනෝපායකට වඩා වැඩියෙන් යමක් උපයා ගත හැකි වන පරිදි විවිධ කලා ශිල්ප හා විද්‍යාවන් පිළිබඳව නිපුණත්වයක් ලබාගත හැකි අධ්‍යාපනයක් ජනතාවට ලබා දීමය. ජනතාව වැඩි වැඩියෙන් උපයන තරමට රටද පොහොසත් වනු ඇත.

මහපොල උසස් අධ්‍යපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදලේ උසස් අභිප්‍රාය එයයි. එහි අරමුණ සපුරාගත් විට ශ්‍රී ලංකාව ඔබටත්, ඔබේ දරුවාටත් ජීවත්වීම සඳහා වඩා හොඳ තැනක් වනවා නිසැකය.

ගරු ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමා 1980 ජනවාරි මාසයේදී මහපොල වැඩ පිළිවෙල ආරම්භ කළේ මේ රටේ පූර්ණ වරප්‍රසාද නොලද ජනතාවට, විශේෂයෙන් ගම්බද ප්‍රදේශවල වෙසන එවැනි ජනතාවට සහනයක් සැලසීම් පිණිසය.

අවුරුදු 17 ක් තිස්සේ පැවති සීමා බන්දන වලුත් මුදා විවෘත ආර්ථිකයකට දොර ඇරීමෙන් පසු එතෙක් පැවැති අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟය තුරන් වී ගිය නමුදු එහි ක්ෂණික වාසිය නාගරිකයනට සීමාවිය. එම වාසි සියල්ලම ගම්බද පෙදෙස් කරා ගෙන ගියේ ඒ මහඟු මහපොලවැඩ පිළිවෙලයි.

## මහපොලවල් 100ක්

දැනට ඉතාමත් සාර්ථක ලෙස එවැනි මහ පොලවල් 37 ක් පවත්වනු ලැබ ඇත. ඉදිරියට තව තවත් පැවැත් වෙනු ඇත. සෑම මහපොලකම ප්‍රවේශ පත්‍ර ගාස්තුව එය පැවැත්වෙන ප්‍රදේශයේ පාසැල්වල සංවර්ධනය සඳහා වෙන් කෙරෙයි. ඇතැම්විට ඉන් කොටසක් ශිෂ්‍යත්ව අරමුදලටද ලැබීන ඉතිරි මුදල පාසැල්වල විද්‍යාගාර පුස්තකාල ක්‍රීඩා භූමි, ගෘහවිද්‍යා, කාමර ආදිය ගොඩ නැංවීමට වැය කෙරිනි.

අධ්‍යාපනය නැංවීම, ශ්‍රී ලංකාවේ අද පවත්නා දිළිඳුකම පිළිබඳ ප්‍රශ්න වලින් නිදහස් වීමට ඇති මාර්ගයක්ය යන අවබෝධය මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකර අරමුදල ආරම්භ වීමට හේතු වූයේය.

1981 ජනවාරි 11 වෙනි දිනුම් ඇදින ලද මහ පොල උසස් අධ්‍යාපන දීප ව්‍යාප්ත ලොතරැයියෙන් රුපියල් ලක්ෂ 70 කට අධික මුදලක් එකතු විය. ඊට අමතරව පුද්ගලයන් කිහිප දෙනෙකුගෙන් හා ආයතන කිහිපයකින් ලැබුණු පරිත්‍යාගයන්ද එයට එකතු කෙරිණි. එසේම තවත් පරිත්‍යාග රැසකට පොරොන්දු ලැබී ඇති අතර ඒවා දැන් එකතු වෙමින් පවතියි.

## මහපොල උසස් අධ්‍යාපන භාරකා අරමුදල

මෙම අරමුදල 1981 පෙබරවාරි මාසයේදී අරඹන ලද්දේ පුද්ගලික භාරකාර අරමුදලක් හැටියටය.

අරමුදලෙන් කෙරෙන ප්‍රථම ශිෂ්‍යත්ව ප්‍රදානය 1982 නොවැම්බර් 14 වෙනිද සිදුවිය. මෙහිදී මුදල් අවශ්‍යතාවයේ පදනම මත සිසුන් 366 දෙනෙකු තෝරා ගනු ලැබූ අතර දක්ෂතාවයේ පදනම මත 45 දෙනෙකු තෝරාගනු ලැබීණ. එම දෙවෙනි වර්ගයට අයත් ශිෂ්‍යත්ව ලාභිනට ඔවුන්ගේ සම්පූර්ණ උසස් අධ්‍යපන කාලය තුළදී මසකට රුපියල් 400 බැගින් ලබා දෙනු ඇති අතර මුල් කොටසටද එම මුළු කාලය සඳහාම මසකට රුපියල් 350/- බැගින් ලබාදෙනු ඇත.

ශිෂ්‍යත්ව සඳහා ලැබෙන සියලු අයදුම් පත් පිළිබඳ කටයුතු කෙරෙන්නේ විශ්ව විද්‍යාළ ප්‍රතිපාදන කොමිසම මගිනි.

## පාර්ලිමේන්තු පනතක්

මෙම ශිෂ්‍යත්ව භාරකාර අරමුදලට ඉහළ තැනක් හා වරප්‍රසාදයක් දියයුතුයයි රජයටද හැඟිණි. ඒ අනුව එය මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදල නමින් පනතක් හැටියට සකස් වී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීණ.

එහිදී කෑෂේත් සහයෝගය මැද ඒකමතිකව සම්මත වූ එම පනත දැන් ව්‍යවස්ථා පුස්තකයට එකතු වී ඇත්තේය. භාරකාර අරමුදලේ පරිපාලනය පහත සඳහන් නිලධාරීන්ගෙන් යුක්ත භාර කාර මණ්ඩලයට පවරා ඇත.

අ. අග්‍ර විනිශ්චයකාරවරයා (සභාපති)

ආ. භාරකාර අරමුදලේ නිර්මාතෘ

ඇ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

ඈ. වෙළඳ හා නාවුක කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

ඉ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සභාවේ සභාපති

ඊ. භාරකාර අරමුදලේ නිර්මාතෘ විසින් අවුරුදු 5 කට නම්කරනු ලැබූ පුද්ගලයන් දෙදෙනෙක්.

## භාරකාර අරමුදලේ අරමුණු හා අභිප්‍රායයන්

1. තරුණයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම.

2. උසස් අධ්‍යාපනය පිළිබඳ ආයතනයක සිය ශාස්ත්‍රීය කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපනය නිම කිරීමට, සුදුසුකම් ඇති තරුණයන්ට ආධාර සැපයීමෙන් ඔවුන්ට පිහිටවීම.

3. වෘත්තීය අභ්‍යාස ආයතනයක් පිහිටුවීම හා එවැන්නක් පරිපාලනය කිරීමේදී උදව් වීම.

4. අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ නියුතු පාසැල් හා ආයතන පිහිටුවීම හා ඒවාට උදව් කිරීම.

5, වැඩිදුර අධ්‍යාපනයේ නියුක්ත පුද්ගලයන්ගේ නිපුණත්වයන් වර්ධනය කිරීමෙන් ඔවුන්ගේ අභිවර්ධනයේ මං සැලසීමෙන් ලා ආධාර සැපයීම.

## බදු සහන

මෙම භාරකාර අරමුදල ආදායම් බද්දෙන් හා ධන බද්දෙන් නිදහස් වේ. අරමුදලේ අරමුණු පිණිස ආනයන කරන ලද භාණ්ඩ රේගු හා තීරු බදු ගාස්තු වලින් නිදහස් වේ. තවද මෙම අරමුදල 1980 අංක 35 දරණ සංවර්ධන මංඩල පනත

යටතේත්, ගාස්තු හා බදු ගෙවීමෙන් නිදහස් වනවා ඇත.

අරමුදලට පරිත්‍යාග කරන කවර කෙනෙකු වුවද භාරකාර

1. තෑගි බද්දෙන් නිදහස්වනවා ඇත.

2. එබඳු පරිත්‍යාග 1979 දේශීය ආදායම් බදු 28 වෙනි පනත අනුව අනුමත කරන ලද වියදම් ලෙස සලකා එය පරිත්‍යාග සම්පූර්ණ අගය සම්බන්ධයෙන් බදු නිදහසකට හිමිකම් ලබනවා ඇත.

එක් ශිෂ්‍යත්වයක් රු. 45000/- සිට රු. 50000/- හා අතර වනවා ඇත.

යම් කෙනෙකුන් මේ අනගි ආධාර ක්‍රමයට පරිත්‍යාගයක් කොට අවසර දී ඇති බදු නිදහස්ද භුක්ති විඳීමට කැමති නම් කොළඹ චෙක්පත් විදිය යේ වෙළඳ හා නාවුක අමාත්‍යාංශයේ ලේකම් නමින්

**මහපොල උසස් අධ්‍යාපන භාරකාර අරමුදලට ඔබගේ ආධාරය එවන්න**